## අධිකරණ අමාත්‍යාංශය

# හදිසි මරණ පරීක්ෂකවරුන් පිළිබඳ ස්ථාවර කාර්ය සංග්‍රහය



# හදිසි මරණ පරීක්ෂකවරුන් පිළිබඳ
# ස්ථාවර කාර්ය සංග්‍රහය

**01. නීතිමය රාමුව**

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 108 වැනි වගන්තිය යටතේ හදිසි මරණ පරීක්ෂකවරුන් පත් කිරීමේ බලය ගරු අධිකරණ අමාත්‍යතුමා වෙත පැවරේ. 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XI හා XXX පරිච්ඡේදයන්හී සඳහන් විධිවිධාන අනුව හදිසි මරණ පරීක්ෂකවරුන් විසින් තම රාජකාරී කටයුතු සිදු කළ යුතුය.

**02. පත්වීමේ ස්වභාවය**

I. හදිසි මරණ පරීක්ෂක තනතුර රජයේ වැටුප් ලබන තනතුරක් නොවන අතර ගරු තනතුරකි. කෙසේ වුවද, හදිසි මරණ පරීක්ෂකවරුන් විසින් සිදු කරනු ලබන මරණ පරීක්ෂණ සඳහා ආයතන සංග්‍රහයේ X වන පරිච්ඡේදයේ 3 වන වගන්තියේ විධිවිධාන අනුව (අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 03/2019 න් සංශෝධිත පරිදි - **ඇමුණුම 01**), අදාළ මහාධිකරණය හරහා ගෙවීම් සිදු කරනු ලැබේ.

II. හදිසි මරණ පරීක්ෂකවරුන්ට රජයේ වැටුප් ලබන වෙනත් කිසිදු තනතුරක සේවය කිරීමට නොහැකි අතර කාර්යාල වේලාවන් හා රජයේ නිවාඩු දින නොසළකා තම සේවය ලබා දිය යුතුය.

III. හදිසි මරණ පරීක්ෂකවරුන්ට තම රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් කිසිදු බාහිර පාර්ශවයකින් කිසිදු ප්‍රතිලාභයක් හෝ මුදලක් ලබා ගැනීමේ හිමිකමක් නොමැත.

**03. මූලික සුදුසුකම්**

I. ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම.

II. මනා චරිතයකින් සහ යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් හෙබි අයෙකු වීම.

III. පත්වීම අපේක්ෂා කරන හදිසි මරණ පරීක්ෂක කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරී වසමක වසර දෙකක ස්ථිර පදිංචිය.

IV. වයස අවුරුදු 30ට නොඅඩු හා අවුරුදු 60ට නොවැඩි වීම.

V. අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී එකවර විෂයයන් 03 කින් සාමාර්ථ ලබා තිබීම. (මෙහිදී විද්‍යා විෂයයන්ගෙන් සාමාර්ථය ලබා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.)

**04. තනතුරට පත්කිරීමේ ක්‍රමවේදය**

**I. ස්ථිර පත්වීම්**

හදිසි මරණ පරීක්ෂක පුරප්පාඩු කොට්ඨාස සඳහා ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ පුවත්පත් නිවේදනයක් පළ කිරීම මගින් අයදුම්පත්‍ර කැඳවා මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව ගරු අධිකරණ අමාත්‍යතුමාගේ අනුමැතිය මත පත්වීම් ලබා දෙනු ලැබේ.

**II. තාවකාලික පත්වීම්**

සේවා අවශ්‍යතාවය මත අත්‍යාවශ්‍ය අවස්ථාවන්වලදී පමණක් ගරු අධිකරණ අමාත්‍යතුමාගේ අනුමැතිය මත, සියලු මූලික සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින් තාවකාලික හදිසි මරණ පරීක්ෂකවරුන් වශයෙන් පත් කල හැකිය.

**III. හදිසි මරණ පරීක්ෂක (මුස්ලිම්) පත්වීම්**

මුස්ලිම් ජනගහනය 5000 හෝ ඊට වැඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට බලපැවැත්වෙන පරිදි සියලු මූලික සුදුසුකම් සපුරා ඇති මෙන්ම දෙමළ භාෂාව හැසිරවීමේ මනා හැකියාවක් සහිත පුද්ගලයින් ව්‍යුහගත සම්මුක පරීක්ෂණයකින් අනතුරුව තාවකාලික පදනම මත උපරිම වසර 01 ක කාලසීමාවක් සඳහා පත් කරනු ලැබේ.

**05. පත්වීමේ කාලසීමාව**

ස්ථිර පත්වීම් වසර 05 ක කාලසීමාවක් සඳහා ලබා දෙනු ලබන අතර තාවකාලික පත්වීම් වසරක කාලසීමාවක් සඳහා ලබා දෙනු ලැබේ.

**06. සේවා දීර්ඝ කිරීම**

**I. ස්ථිර පත්වීම්**

ස්ථිර හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ පළමු වසර 05 ක ධූර කාලයේදී සතුටුදායක සේවාකාලයක් සම්පූර්ණ කරන්නේ නම් අදාළ මහේස්ත්‍රාත්තුමාගේ නිර්දේශය මත පොලිස් වාර්තාවක්ද සළකා බලා වයස අවුරුදු 60 දක්වා වසර 05 බැගින් සේවා දීර්ඝ ලබා දීමට සළකා බලනු ලැබේ.

**II. තාවකාලික පත්වීම්**

තාවකාලික හදිසි මරණ පරීක්ෂකවරුන් වසරක ධූර කාලයේදී සතුටුදායක සේවාකාලයක් සම්පූර්ණ කරන්නේ නම්, අදාළ මහේස්ත්‍රාත්තුමාගේ නිර්දේශය මත පොලිස් වාර්තාවක්ද සළකා බලා සේවය දීර්ඝ කිරීම සම්බන්ධව සලකා බලනු ලැබේ.

එසේම, තාවකාලික හදිසි මරණ පරීක්ෂකවරුන් ස්ථිර පත්වීම් ලබා ගැනීමට සියලු සුදුසුකම් සපුරා ඇත්නම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව ඔවුන්ට ස්ථිර හදිසි මරණ පරීක්ෂක පත්වීම් ලබා දීමට සළකා බලනු ලැබිය හැකිය.

**III. වයස අවුරුදු 60 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම**

ස්ථිර / තාවකාලික හදිසි මරණ පරීක්ෂකවරුන් සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට ඇත්නම් හා තවදුරටත් සේවය කිරීම සඳහා සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුතු බවට දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතිකයකින් තහවුරු කරන්නේ නම්, අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගෙන් පසුබිම් වාර්තාවක් හා අදාළ මහේස්ත්‍රාත්තුමාගේ නිර්දේශයක් ලබා ගැනීමෙන් අනතුරුව වයස අවුරුදු 60 න් ඔබ්බට සේවය දීර්ඝ කිරීම සම්බන්ධව සලකා බලනු ලැබේ. වයස අවුරුදු 60 න් ඔබ්බට ගරු අධිකරණ අමාත්‍යතුමාගේ අනුමැතිය මත වසර 02 බැගින් උපරිම වයස 70 දක්වා සේවා දීර්ඝ කිරීම සිදු කළ හැකිය.

## 07. විනය පාලනය

හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ විනය බලධාරියා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා වන අතර ඔහු විසින් ලබා දෙන උපදෙස් හා නියෝග අනුව රාජකාරී සිදු කල යුතුය. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ නියෝග පහර හැරීමක් සම්බන්ධව හෝ රාජකාරිය පැහැර හැරීමක් සම්බන්ධව අධිකරණ අමාත්‍යාංශය වෙත ලැබෙන යම් පැමිණිල්ලක් පිළිබඳව අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා හරහා හෝ අදාළ ප්‍රදේශයේ දිස්ත්‍රික් ලේකම් විසින් නම් කරනු ලබන යම් රජයේ නිලධාරියෙකු හරහා සිදු කරනු ලබන විමර්ශනයකින් අනතුරුව විනය පියවර ගනු ලැබේ.

## 08. සේවය අවසන් වීම

I. විනය හේතූන් මත, කරුණු දක්වා ඕනෑම මොහොතක හදිසි මරණ පරීක්ෂකවරයෙකුගේ සේවය අවසන් කිරීමේ බලය අධිකරණ අමාත්‍යතුමා සතු වේ.

II. එසේම, යම් හදිසි මරණ පරීක්ෂකවරයෙක්ගේ පත්වීම් ලිපියේ සඳහන් කාලය ඉකුත් වුවහොත් හෝ වයස අවුරුදු 70 සම්පූර්ණ වුවහොත් හෝ රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / රාජ්‍ය සංස්ථාවක / කොමිෂන් සභාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක තනතුරකට පත් වුවහොත් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතන සභිකයකු වශයෙන් තේරී පත්වුවහොත් හදිසි මරණ පරීක්ෂක තනතුර අහෝසි වේ.

## 09. හදිසි මරණ පරීක්ෂක බලප්‍රදේශ

I. සෑම උපත් හා මරණ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයක් සඳහාම හදිසි මරණ පරීක්ෂකවරයෙකු පත් කරනු ලබන අතර සේවා අවශ්‍යතාවය අනුව අධිකරණ අමාත්‍යතුමාගේ අනුමැතිය මත දිවයිනේ ප්‍රධාන රෝහල් සඳහාද අවස්ථානුකූලව හදිසි මරණ පරීක්ෂකවරුන් පත් කරනු ලැබේ.

II. එසේම, අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා බල පැවැත්වෙන පරිදි හදිසි මරණ පරීක්ෂක (මුස්ලිම්) පත්වීම් ලබා දෙනු ලැබේ.

## 10. සේවයට වාර්තා කිරීම

I. සියලුම හදිසි මරණ පරීක්ෂකවරුන් තම බලප්‍රදේශයට අදාළ මහේස්ත්‍රාත්වරයා වෙත වාර්තා කල යුතු වන අතර අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ විධිවිධානවලට යටත්ව රාජකාරී කටයුතු සිදු කල යුතුය.

II. එක් බලප්‍රදේශයක් / රෝහලක් සඳහා හදිසි මරණ පරීක්ෂකවරුන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පත් කොට ඇති අවස්ථාවන්වලදී රාජකාරී දින වෙන් කර ගැනීම සම්බන්ධව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙතින් උපදෙස් ලබා ගත යුතු වේ.

## 11. දේශීය හා විදේශ නිවාඩු

සතියේ දිනවලදී මෙන්ම රජයේ නිවාඩු දින හා සති අන්ත දිනවලද කාර්යාල වේලාවන් නොසළකා අවශ්‍යතාවය පරිදි තම සේවය සැපයීමට සියලුම හදිසි මරණ පරීක්ෂකවරුන් බැඳී සිටී. දේශීය හෝ විදේශ නිවාඩු ලබා ගැනීමට හදිසි මරණ පරීක්ෂකවරුන් අදහස් කරන්නේ නම් තම රාජකාරී ආවරණය

සඳහා යාබද කොට්ඨාසයක හදිසි මරණ පරීක්ෂකවරයෙකුගේ නමක් ද සහිතව අදාළ ඉල්ලීම අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු වේ. මේ සඳහා isd@moj.gov.lk යන විද්‍යුත් ලිපිනය භාවිත කළ හැකිය.

**12. මරණ පරීක්ෂණ සිදු කිරීම**

I. 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන අනුව මාතෘ මරණ, සිය දිවි හානි කරගැනීමෙන් සිදු වූ මරණ, සතකු විසින් සිදු කරනු ලබන මරණ, යන්ත්‍රෝපකරණ නිසා සිදුවන මරණ, අපරාධයක් නිසා සිදුවන මරණ, හදිසි අනතුරුවලට ලක්වූ මරණ, හා නිශ්චිත හේතුවක් නොදන්නා හදිසි මරණ, මානසික රෝහලකදී, ලාදුරු රෝහලකදී පොලිස් භාරයේදී හෝ බන්ධනාගාරයේදී සිදුවන මරණ සම්බන්ධයෙන් මරණ පරීක්ෂණ සිදු කල යුතුය.

II. මරණ පරීක්ෂණයක් පවත්වන හදිසි මරණ පරීක්ෂකවරයාගේ කාර්යය අපරාධයක් හෝ වරදක් විභාග කිරීම නොවන අතර මරණයට හේතුව හා එය සිදු වූ අකාරය පිළිබඳව අධිකරණයට කරුණු වාර්තා කිරීම වේ.

III. හදිසි මරණයක් පිළිබඳව තොරතුරක් ලැබුණු වහාම මිය ගිය තැනැත්තාගේ සිරුර තිබෙන ස්ථානයට වහාම ගොස් පරීක්ෂණය පැවැත්වීම අත්‍යාවශ්‍ය වේ. සිරුර වෙනත් ස්ථානයකට රැගෙන එන ලෙස ඥාතීන්ට දැන්වීම කිසිසේත්ම සිදු නොකළ යුතුය.

IV. සෑම මරණ පරීක්ෂණයක් සම්බන්ධවම හ.ම.ප 01 ආකෘතිය (**ඇමුණුම 02**) පිටපත් දෙකකින් යුක්තව නිසි පරිදි සම්පූර්ණ කොට එම වාර්තාවේ එක් පිටපතක් මහේස්ත්‍රාත්වරයා වෙත වහාම ඉදිරිපත් කිරීමටද, අනෙක් පිටපත හදිසි මරණ පරීක්ෂක සතුව විධිමත් පරිදි ගොනු කොට තබා ගැනීමටද කටයුතු කළ යුතුය. අධිකරණ අමාත්‍යාංශය විසින් ඉල්ලා සිටිනු ලබන ඕනෑම අවස්ථාවකදී එම පිටපත ලබා දිය යුතුය.

V. යම් මරණයක් සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු විසින් පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදු කල යුතුද යන්න තීරණය කිරීමේ වගකීම හදිසි මරණ පරීක්ෂකවරයා වෙත පැවරේ. අධිකරණයේ නඩුවකට යොමු විය හැකි සෑම සැක සහිත මරණයක්ම මෙන්ම මිනීමැරීමක් හෝ රිය අනතුරක් නිසා හෝ සිදුවන මරණ මෙන්ම නිශ්චිත හේතුව සොයා ගැනීමට නොහැකි මරණ පශ්චාත් මරණ පරීක්ෂණයක් සඳහා අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත යොමු කිරීම අනිවාර්ය වේ.

VI. රෝහලකට ඇතුලත් කිරීමෙන් අනතුරුව සිදුවන මරණ පිළිබඳව හදිසි මරණ පරීක්ෂණ එම රෝහලට පත් කොට ඇති හදිසි මරණ පරීක්ෂකවරයෙකු සිටී නම් ඔහු විසින්ද, එසේ නොමැති නම් එකී රෝහල අයත්වන බලප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක විසින්ද සිදු කල යුතුය.

VII. යම් හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසයක් තුල යම් මරණයක් සිදු වී ඒ පිළිබඳව මරණ පරීක්ෂණය රෝහලකදී පැවැත්වීමට සිදු වන්නේ නම් එම පරීක්ෂණය මරණය සිදුවූ හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසයේ හදිසි මරණ පරීක්ෂකවරයා විසින් පැවැත්විය යුතුය.

VIII. මාතෘ මරණ සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 13/2018 (**ඇමුණුම 03**) හි සඳහන් උපදෙස් අනුව කටයුතු කල යුතුය.

**13. පොදු උපදෙස්**

I. හදිසි මරණ පරීක්ෂක තනතුර සම්භාවනීය තනතුරක් වන අතර අධිකරණ ක්‍රියාවලියට සහාය වීම සඳහා පිරිනමනු ලබන තනතුරකි. එම තනතුරේ අභිමානය හා ගෞරවය රැකෙන අයුරින් සියලුම හදිසි මරණ පරීක්ෂකවරුන් කටයුතු කළ යුතු වේ.

II. හදිසි මරණයක් සිදු වූ පසුව තම රාජකාරිය අනලස්ව හා දැඩි වගකීමකින් හා අවධානයකින් යුතුව අවංකව හා අපක්ෂපාතීව සිදු කිරීමත්, මරණ පරීක්ෂණයක් පවත්වා එම හදිසි මරණයට පත්වූ පුද්ගලයාගේ මෘත ශරීරය ඉතා කඩිනමින් ඥාතීන්ට භාරදීමත් සියලුම හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ වගකීම වේ.

III. ඉස්ලාමීය ආගමානුකූලව මුස්ලිම් ජාතිකයින්ගේ මෘත ශරීර පැය 24 ක් ඇතුලත භූමදානය සිදු කළ යුතු වන බැවින් ඒ සම්බන්ධව නිසි සැළකිල්ලෙන් කටයුතු කළ යුතුය.

IV. සියලුම හදිසි මරණ පරීක්ෂකවරුන් සඳහා ලියාපදිංචි අනුක්‍රමික අංකයක් ලබා දෙනු ලැබේ. තම නිල මුද්‍රාවේ මෙන්ම අනෙකුත් රාජකාරී කටයුතුවලදී එම ලියාපදිංචි අංකය සඳහන් කළ යුතුය.

V. හදිසි මරණ පරීක්ෂණ සඳහා සහභාගී වීමේදී තනතුරේ ගරුත්වය ආරක්ෂා වන පරිදි සුදුසු ඇඳුමකින් සැරසී සිටීම අනිවාර්ය වේ. යුරෝපීය ඇඳුම භාවිත කරන්නේ නම් කළු පැහැති කලිසමක්, සුදු පැහැති කමිසයක් හා කළු පැහැති ටයිපටියක් පැළඳ සිටීමද ජාතික ඇඳුම භාවිත කරන්නේ නම් සුදු පැහැති සරමක් හා කමිසයක් භාවිත කිරීමද වඩාත් යෝග්‍ය වේ.

VI. අධිකරණ අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව පත්වීම ලබා දී ඇති කාලසීමාවෙන් ඔබ්බට සේවා කිරීම සිදු නොකළ යුතු අතර සේවා දීර්ඝ කිරීමක් අවශ්‍ය වන්නේ නම් පත්වීම ඉකුත් වීමට අවම වශයෙන් මාස 03 කට පෙර ඉල්ලීමක් ඉදිරිපත් කල යුතුය.

VII. තම පත්වීම් ලිපියේ සඳහන් බලප්‍රදේශයේ හැර වෙනත් බලප්‍රදේශවලට අදාළ මරණ පරීක්ෂණ සිදු නොකළ යුතුය. නමුත් නොවැළැක්විය හැකි හේතුවක් මත අදාළ බලප්‍රදේශයට පත් කොට ඇති හදිසි මරණ පරීක්ෂකවරයාට යම් මරණ පරීක්ෂණයක් සිදු කළ නොහැකි විටදී අදාළ මහේස්ත්‍රාත්තුමාගේ අවසරය මත අධිකරණ අමාත්‍යාංශයේ ආවරණ අනුමැතියට යටත්ව මරණ පරීක්ෂණයක් සිදු කළ හැකිය.